ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 මැයි මස 21 වන දින |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ දී තවදුරටත් පහළ යන ලදී

**මතුපිට උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 5.9%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.1%
මාසික වෙනස : -0.3%

**මූලික උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 3.2%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.0%
මාසික වෙනස : 0.7%







ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 මාර්තු මාසයේ පැවති සියයට 7.0හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 5.9 දක්වා පහළ යන ලදී. ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික පහළ යෑම සහ 2019 අප්‍රේල් මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2020 මාර්තු මාසයේ දී සියයට 14.1හි පැවති ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය, 2020 අප්‍රේල් මාසයේ දී සියයට 12.2 දක්වා පහළ යන ලදී. මේ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය ද, 2020 මාර්තු මාසයේ දී පැවති සියයට 1.8හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 1.1 දක්වා පහළ යන ලදී.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2020 මාර්තු මාසයේ පැවති සියයට 4.9හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 5.1 දක්වා ඉහළ ගියේය.

---

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

2020 අප්‍රේල් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට -0.3ක් ලෙස වාර්තා වූ අතර, ආහාර බෝගවල සෘතුමය අඛණ්ඩ සැපයුම හේතුවෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම මේ සඳහා බලපාන ලදී. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි එළවළු, පලතුරු, ලොකුළූණු සහ බිත්තර මිල ගණන් මෙම මාසය තුළ දී පහළ යන ලදී. මේ අතර, 2020 අප්‍රේල් මාසයේ දී ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් නොවෙනස්ව පැවතුණි. COVID-19 වසංගතය රට තුළ ව්‍යාප්ත වීමත් සමග පැනවූ රට වසා දැමීමේ (lockdown) කාලසීමාව තුළ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සහ සේවා සඳහා ඇති ඉල්ලුම පහළ යෑම ද මේ සඳහා යම්තාක් දුරකට දායක විය.

තවද, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ දී සියයට 3.2හි නොවෙනස්ව පැවති අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 මාර්තු මාසයේ දී පැවති සියයට 5.2හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 5.0 දක්වා පහළ යන ලදී.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 | 4.9 | 5.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 | 5.1 | 5.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව